ජාතික මාර්ග ජාල ව්‍යාපෘතිය නායයෑම් ආපදාවලින් ආරක්ෂා කරගැනීමේ ව්‍යාපෘතිය - 2013

---

ජාතික මාර්ග ජාල ව්‍යාපෘතිය නායයෑම් ආපදාවලින් ආරක්ෂා කරගැනීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල් - පී 109 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ පිළිවෙලින් එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරියයි (මාසංඅ). මධ්‍යම, ඌව හා සබරගමු පළාත් කඳුකර ප්‍රදේශවල සුදුසු ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් මූලික යටිතල පහසුකම් ලෙස ඒ - පන්තියේ ජාතික මාර්ග සඳහා ඉලක්ක කරමින් නායයාම් ආපදාව අවමකිරීම හා එමඟින් ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායක වීම හා මාර්ග ජාලයේ ආරක්ෂාව වැඩිකිරීම සහ මාර්ග භාවිතා කරන්නන් හා නිවැසියන් ඇතුළත් ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමයි.

පහත සඳහන් කාර්යයන් සිදුකිරීම සඳහා ණය මුදල ලබා දී ඇත,

(i) මාර්ග ආපදා කළමනාකරණ ආකෘතිය (model) සඳහා ප්‍රතික්‍රියාමාර්ග ගැනීම,
(ii) ආපදා කළමනාකරණය හා වෙනත් අදාළ පහසුකම් සඳහා ජාතික මාර්ග පිළිබඳ ඉහළ ප්‍රමුඛතා ප්‍රදේශ සඳහා ප්‍රති ක්‍රියාමාර්ග ගැනීම,
(iii) ආපදා කළමනාකරණ කටයුතු සඳහා පූර්ව අනතුරු හැඟවීම් පද්ධතිය ස්ථාපිත කිරීම, සහ
(iv) උපදේශක සේවා සැපයීම.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,754 ක් වන අතර ඉන් රු. මිලියන 11,423 කට සමාන ජපන් යෙන් මිලියන 7,619 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි.ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**------------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3.** **මතය**

**------------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**4.1 මූල්‍ය කාර්යසාධනය**

**---------------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.12,000,838 ක් විය. සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **වියදම් විෂයය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වියදම** |
|---|---|
| ------------------- | -------------------------------------------- |
| | **රු.** |
| ස්ථාවර වත්කම් | 3,025,957 |
| කෙරීගෙන යන වැඩ | 8,950,206 |
| ජංගම වත්කම් | 24,675 |
| | --------------- |
| එකතුව | 12,000,838 |
| | ========= |

**4.2 අග්‍රිම අරමුදල් ගිණුම**

**-------------------------**

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**5. විගණන නිරීක්ෂණ**

**5.1 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**6.1 අරමුදල් උපයෝජනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ අයවැයගත ප්‍රතිපාදන හා අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට තත්ත්වය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජ ජා ස නි | 7,619 | 11,423 | 500 | - | - |
| ශ්‍රී ලං ර | - | 3,331 | 100 | 10.8 | 10.8 |
| එකතුව | 7,619 | 14,754 | 600 | *10.8 | 10.8 |

* ගෙවිය යුතු මුදල් ඉවත් කිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

6.2 භෞතික කාර්යසාධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින ණය ගිවිසුමට එළඹ තිබුණු නමුත් 2012 ඔක්තෝබර් සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.